16 ඒකකය - බලය හා චලිතය(2)

✓ **පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.**

ක්‍රියාකාරකම 16.2

පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන්න. එහි දී සිදු කර ඇත්තේ ඇදීමක් ද නැතහොත් තල්ලු කිරීමක් ද යන බව සටහන් පොතෙහි පහත ආකාර වගුවක දක්වන්න.

ක්‍රියාකාරකම	සිදු කර ඇත්තේ ඇදීමක් ද තල්ලු කිරීමක් ද?
මේසයක් තල්ලු කිරීම	තල්ලු කිරීමක්
ලීදෙන් වතුර ඇදීම	ඇදීමක්
බෑගය එසවීම	
බයිසිකලය පැදීම	
කරාමයක් කරකැවීම	
බෝලයකට පහරක් එල්ල කිරීම	
පෑනෙන් ලිවීම	
බුරුසුවෙන් දත් මැදීම	
පොතෙහි ලියන ලද පැන්සල් ඉරි මැකීම	
පාපැදියේ තිරිංග ඇල්ලීම	

- **බලයක් යෙදීම** යන්න විස්තර කරන්න.

.....

ක්‍රියාකාරකම 16.3

අවශ්‍ය ද්‍රව්‍ය :- සමාන ලී කුට්ටි දෙකක්, රබර් පටියක්, දුනු තරාදියක්

ක්‍රමය :-

- ලී කුට්ටියක් මේසයක් මත තබා රබර් පටියක් සම්බන්ධ කර ගනිමින් රබර් පටියෙන් අදින්න.
- ලී කුට්ටිය මත අනෙක් ලී කුට්ටිය තබා නැවත රබර් පටියෙන් අදින්න.

- ලී කුට්ටි අදින ලද ඉහත අවස්ථා දෙකේ දී රබර් පටිය ඇදුනු ප්‍රමාණ සහ බලය යෙදූ ප්‍රමාණයන් පිළිබඳව ඔබේ අදහස් ලියන්න.(වැඩි ප්‍රමාණයක් ඇදුණු අවස්ථාව, වැඩි බලයක් යෙදූ අවස්ථාව ආදිය පිළිබඳව)

  .....

  .....

  .....

  .....

- බලයක ඇති ප්‍රධාන ලක්ෂණ දෙක මොනවාද?

  .....

  .....

- වස්තුවක් මත බලයක් යෙදීම මගින් සිදු කළ හැකි දෑ උදාහරණ සමගින් විස්තර කරන්න.

  .....

  .....

  .....

  .....

  .....

  .....

  .....

  .....

  .....

  .....

  .....

  .....

  .....

පහත සඳහන් ප්‍රකාශන වල හිස්තැන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය පද වරහන තුළින් තෝරා ගන්න.

(චලිතයක්, දිශාවක්, නිවුටන්, දුර, දිග, බලයක්, නිශ්චල, විස්ථාපනය, ඇදීමක්, විශාලත්වයක්)

1. බලයක් යෙදීමෙන් ..... වස්තුවක් චලනය කළ හැක.
2. බලයකට ..... හා නිශ්චිත දිශාවක් ඇත.
3. ..... විශාලත්වයක් පමණක් ඇති මිනුමකි.
4. විස්ථාපනය විශාලත්වයක් හා නිශ්චිත ..... සහිත මිනුමකි.
5. ..... හෝ තල්ලු කිරීමක් බලයක් යෙදීම ලෙස හැඳින්වේ.
6. කාලයත් සමඟ වස්තුවක පිහිටි ස්ථානය වෙනස්වීම ..... ලෙස හැඳින්විය හැක.
7. දුර ලෙස සලකනු ලබන්නේ චලිතයේ දී ගෙවා ගිය ගමන් මගෙහි සම්පූර්ණ ..... ය.
8. ..... යෙදීමෙන් චලනය වන වස්තුවක වේගය වෙනස් කළ හැක.
9. බලය මනින සම්මත ඒකකය ..... වේ.
10. ..... ලෙස සලකනු ලබන්නේ චලිතය ආරම්භ කළ ස්ථානයත් චලිතය අවසන් කළ ස්ථානයත් අතර දුරයි.